# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2019
## First Term Test - 2019

ඉතිහාසය - I, II
History - I, II

කාලය පැය 2 යි.

නම :- ............................................ විභාග අංකය :-

9 ශ්‍රේණිය

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ලන්දේසීන් ස්පාඤ්ඤයට එරෙහිව නිදහස් සටනක් ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් වන්නේ,
(i) ලන්දේසි රෙපරමාදු භක්තිකයන් බවට පත්වීම.
(ii) ස්පාඤ්ඤවරුන්ට ලිස්බන් වරායට පැමිණීමට නොහැකිවීම.
(iii) ලන්දේසීන්ට ලිස්බන් වරායට පැමිණීමට නොහැකි වීම.
(iv) ස්පාඤ්ඤවරුන් රෙපරමාදු භක්තිකයන් වීම.

(02) ලන්දේසීන්ගේ මව්රට වන්නේ,
(i) ඕලන්දය (ii) ස්පාඤ්ඤය (iii) පෘතුගාලය (iv) බ්‍රිතාන්‍ය

(03) "VOC" සමාගම යනු,
(i) පෙරදිග පෘතුගාල වෙළඳ සමාගම
(ii) අපරදිග ඉංග්‍රීසි වෙළඳසමාගම
(iii) අපරදිග ඕලන්ද වෙළඳසමාගම
(iv) පෙරදිග ඕලන්ද වෙළඳසමාගම

(04) ලන්දේසීන් පෘතුගීසීන්ගෙන් අල්ලාගත් බලකොටුවක් නොවන්නේ,
(i) කල්පිටිය (ii) කොළඹ (iii) හම්බන්තොට (iv) යාපනය

(05) 1656 වර්ෂයේදී දෙවන රාජසිංහ රජු හමුවූ ලන්දේසි දූතයා,
(i) ජොරිස් වැන් ස්පිල්බර්ජන් (ii) කලන් අල්බස්
(iii) කොර්නේලියස් ටැකල් (iv) ජෙරාඩ් හල්ෆ්ට්

(06) ලන්දේසීන්ගෙන් නැව් ලබාගෙන සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම සංවිධානය කළ රජතුමා,
(i) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
(iii) ශ්‍රී විජයරාජසිංහ රජතුමා (iv) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා

(07) 1766 ගිවිසුම අත්සන් කළ ලන්දේසි ආණ්ඩුකාරවරයා,
(i) කර්නල් අල්බස් (ii) විලෙම් පැලක්
(iii) කොරනේලිස් ටැකල් (iv) ජෙරාඩ් හල්ෆට්

(08) ලන්දේසීන් යටතේ පැවති කොමාන්ඩරිවලට අයත් නොවන්නේ,
(i) ත්‍රිකුණාමලය (ii) ගාල්ල (iii) යාපනය (iv) කොළඹ

(09) "තෝම්බු" සැකසීම මගින් ලන්දේසීන් ලබා නොගත් තොරතුරක් වන්නේ,
(i) ගමක වැසියන් ගණන (ii) අයකරගත හැකි බදු ප්‍රමාණය
(iii) කාළගුණ අනාවැකි (iv) ඉඩම් හා වගාවන් පිළිබඳ විස්තර

(10) මෙරට නායක්කාර් වංශිකයන්ගේ හැසිරීම නිසා කලකිරීම ඇති වූ ජන කණ්ඩායම වන්නේ,
(i) උඩරට රදළවරුන් (ii) ලන්දේසීන්
(iii) මුස්ලිම් වෙළඳුන් (iv) ඉංග්‍රීසීන්

(11) බ්‍රිතාන්‍යයන්ට සුළි සුළං වලින් නැව් ආරක්ෂා කරගතහැකිවූ මෙරට ස්වභාවික වරායක් වන්නේ,
(i) කොළඹ (ii) යාපනය (iii) ත්‍රිකුණාමලය (iv) මන්නාරාම

(අනෙක් පිටුව බලන්න.)

(12) කිච් ලිපිය අත්සන් කළේ,
(i) අටවන විලියම් රජු (ii) පස්වන එඩ්වඩ් රජු
(iii) අටවන එඩ්වඩ් රජු (iv) පස්වන විලියම් රජු

(13) ලන්දේසීන් යටතේ පැවති ඉහළම උසාවිය වන්නේ,
(i) පිස්කල් උසාවි (ii) ලැන් රාද් (iii) රාද් වැන් ජස්ටිට් (iv) සිවිල් රාද්

(14) 1803 වර්ෂයේ දී උඩරට ආක්‍රමණය කිරීම සඳහා හමුදා කණ්ඩායම් දෙකක් උඩරටට පිටත් වූ ස්ථාන දෙක වන්නේ,
(i) කොළඹ හා ත්‍රිකුණාමලය (ii) කොළඹ හා මඩකලපුව
(iii) යාපනය හා ගාල්ල (iv) යාපනය හා ත්‍රිකුණාමලය

(15) 1818 නිදහස් සටනට ආසන්නතම හේතුව,
(i) ඉංග්‍රීසි සොල්දාදුවන් උඩරට රාජධානියේ වෙහෙර විහාර විනාශ කිරීම.
(ii) උඩරට රාජධානියට මාෂල් ලෝ හෙවත් යුධ නීතිය පැනවීම
(iii) මඩුගල්ලේ මහාධිකරම්ට යුධ අධිකරණයක් මගින් මරණ දඬුවම පැනවීම.
(iv) හජ්ජි මරික්කාර් නැමති මුස්ලිම් ජාතිකයෙකු වෙල්ලස්සේ මුහන්දිරම් ලෙස පත් කිරීම.

(16) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියාවක් නොවන්නේ,
(i) මත්පැන් පානය
(ii) සබරගමුව දිශාව කොටස් දෙකකට බෙදීම.
(iii) ඇහැලේපොළ අධිකාරම්ට මරණ දඬුවම පැමිණවීම.
(iv) පරණතාල කුඩා උන්නාන්සේට මරණ දඬුවම දිම.

(17) කීර් ති ශ්‍රී රාජසිංහ රජු මියගිය පසු උඩරට රාජධානියේ රජ වූයේ,
(i) පළමු වන රාජසිංහ රජතුමා (ii) රාජාධිරාජසිංහ රජතුමා
(iii) දෙවන රාජසිංහ රජතුමා (iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

(18) පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසි යන යුරෝපා ජාතීන් පිහිටුවාගත් වෙළඳ මධ්‍යස්ථාන පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) ගෝව, බතාවිය, මද්‍රාසිය (ii) බතාවිය, ගෝව, කැලිකට්
(iii) ගෝව, මද්‍රාසිය, බතාවිය (iv) මද්‍රාසිය, බතාවිය, ගෝව

(19) උඩරට රාජ්‍ය හා ඉංග්‍රීසීන් අතර දෙවන දූත ගමනේදී රාජාධිරාජසිංහ රාජසිංහ රජතුමා හමුවූ ඉංග්‍රීසි නියෝජිතයා මොහුය.
(i) ජෝන් ෆයිබස් (ii) ජෝන් ඩොයිල්
(iii) රොබට් අන්ඩෘස් (iv) හියු බොයිඩ්

(20) කර්නල් ද මියුරන් යටතේ මියුරන් කොමිසම පත්කර එවීමට බලපෑ ප්‍රධානතම හේතුව වූයේ,
(i) ලංකාවේ අදායමට වඩා වියදම ඉහළයාම නිසා.
(ii) 1747 මුහුදුබඩ ඇතිවූ කැරැල්ලට හේතු සොයා බැලීමට.
(iii) 1803 ඉංග්‍රීසින්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට හේතු සොයා බැලීම.
(iv) ද්විත්ව පාලනය අසාර් ථක වීමට හේතු සොයා බැලීමට.

(ලකුණු 20 x 2 = 40)


(අනෙක් පිටුව බලන්න.)

## II කොටස

• **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**(01)**

(අ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි දක්වා ඇති අක්ෂරවලට අදාල නම් පහත ලැයිස්තුවෙන් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.




i. කල්පිටිය

ii. මහනුවර

iii. මීගමුව

iv. මාතර

v. ගාල්ල

vi. ත්‍රිකුණාමලය

(ලකුණු 06)

(ආ) (i) 16 වන සියවස වන විට යුරෝපයේ විසූ පහත සඳහන් ජාතීන් ඇදහූ ආගම් වර්ග නම් කරන්න.

A. ලන්දේසීන් ......................................

B. ස්පාඤ්ඤවරු ......................................

(ලකුණු 02)

(ii) ඕලන්ද රජයෙන් ලැබුණු බලතල අනුව VOC සමාගමට ආසියාවේ සිදු කිරීමට පැවරුණු කාර්යන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

**(02)**

I. 1638 ගිවිසුමේ ප්‍රධාන කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 04)

II. 1656 වර්ෂයේ දී පෙරාඩ් හල්ෆිට් නැමති ලන්දේසි දූතයා මෙරට රජුට දුන් තෑගි වර්ග වලට නිදසුන් හතරක් ලියන්න. (ලකුණු 04)

III. පහත සඳහන් ලන්දේසි දූතයන් මෙරටට පැමිණීමට හේතු සඳහන් කරන්න.

a) කලන් අල්බස්

b) කොරනේලියස් වැකල්

c) ජොර් සි වැන් ස්පිල්බර්ජන්

d) පෙරාඩ් හල්ෆ්ට්. (ලකුණු 04)

**(03)**

I. සහල් හා රෙදිපිළි විදේශවලින් ආනයනය කිරීමෙන් වෙළඳ සමාගමට වැයවන මුදල් අඩුකර ගැනීම සඳහා හා ආදායම් ලබා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

II. ලන්දේසීන් රෙපරමාදු ආගම මෙරටට ප්‍රචාරය කිරීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. ලන්දේසි පාලන සමයේ දී සමාජ හා සංස්කෘතියට සිදුවූ බලපෑම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

**(04)**

I. බ්‍රිතාන්‍යයන්ට ශ්‍රී ලංකාවේ පිහිටීම වැදගත්වීමට හේතු දෙකක් කෙටියෙන් පැහැදිළිකරන්න. (ලකුණු 04)

II. ක්‍රි.ව. 1797 වර්ෂයේදී මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවූ කැරලිවලට බලපෑ හේතු දෙකක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

III. ක්‍රි.ව. 1796 වර්ෂයේ සිට 1815 දක්වා උඩරට රාජධානිය යටත් කරගැනීම දක්වා මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලනයේ කැපී පෙනෙන අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 04)

**(05)**

I. ක්‍රි.ව. 1803 උඩරට ආක්‍රමණයට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

II. ක්‍රි.ව. 1803 ආක්‍රමණයේ දී මහනුවර නගරය අල්ලාගත් නමුත් නැවත ඉංග්‍රීසි හමුදාවට පසු බැසීමට සිදුවූ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

III. පෘතුගීසීන් හෝ ලන්දේසීන් හෝ නොලද ජයක් උඩරට දී බ්‍රිතාන්‍යයන්ට ලබාගැනීමට හැකි වූ හේතු දෙකක් පැහැදිළි කරන්න. (ලකුණු 04)

**(06)**

I. ක්‍රි.ව 1815 උඩරට ආක්‍රමණයේදී ඉංග්‍රීසීන්ට පහසුවෙන් උඩරට අත්පත් කරගැනීමට බලපෑ හේතු සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

II. ක්‍රි.ව 1815 මාර්තු 2වන දින අත්සන් කළ උඩරට ගිවිසුමේ වගන්ති දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

III. 1818 කැරැල්ලට නායකත්වය දුන් ජාතික නායකයින් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

**(07)** පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳ විස්තර කරන්න.

I. ජෝන් ඩොයිල්

II. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

III. කිව් ලිපිය

IV. ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු. (ලකුණු 4 x 3 )